---

බිංගිරිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). රු.1,446,860 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුම යටතේ ප්‍රාග්ධනිත කර තිබියදී, එම වටිනාකම් නැවත 2012 දෙසැම්බර් 31 දිනට අතැති තොග ශේෂයට ගෙන තිබීම මත සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් රු.1,446,860 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායකය වු රු.196,779 ක් සහ සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ප්‍රමාණය වූ රු.4,206,939 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). ප්‍රාග්ධන ලැබීම් යටතේ ලැබී තිබූ රු.11,315,462 ක් ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබූ අතර එයින් ඉකුත් වර්ෂ වලට අදාල ප්‍රමාණයන් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.1,500,000 ක් ප්‍රාග්ධන ලැබීම් යටතට ගෙන නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.47,880,760 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,499,269 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,257,241 ක් විය.

### 2.2 <u>නිරවුල් නොකළ ගිණුම්</u>

(අ). ආදායම් ණයගැතියන් තුල රාජ්‍ය මුදල් හා ගිණුම් අධ්‍යක්ෂ ලෙස රු.200,000 ක්ද පළාත් පාලන කොමසාරිස් (වයඹ) ලෙස රු.8,038,934 ක්ද දීර්ඝ කාලයක සට පැවත එන නිරවුල් නොකල ශේෂයන් පැවතුණි.

(ආ). විවිධ ණය හිමියෝ තුල පවතින වර්ෂ ගණනාවක සිට පැවත එන උඩුබද්දාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යතු රු.2,435,693 ක ශේෂයද, ජල ව්‍යාපෘති ණය හිමියන් ලෙස පවතින රු.310,132 ක ශේෂයද සමාලෝචිත වර්ෂයේදි නිරවුල් කර නොතිබුණි.

### 2.3 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 790 | 333 | 313 |
| (ii) | බදුකුලී | 8,133 | 10,633 | 344 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,110 | 1,320 | 123 |
| (iv) | වෙනත් ආදායම් | 44,552 | 33,810 | 19,240 |

#### 2.3.2 <u>වරිපනම් බදු</u>

වරිපනම් හා අක්කර බදු යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට පිලිවෙලින් රු.106,536 ක් හා රු.205,784 ක හිඟයක් පැවතුණි.

#### 2.3.3 <u>බදුකුලී</u>

(අ). වාර්ෂික වත්කම් බදුදීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට මස්කඩ 03 කට අදාලව රු.441,115ක හිඟයක් පැවතුණි. එයින් රු.241,038 ක් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන පැවති අතර, ඉතිරි කඩ 2 කට අදාලව තවදුරටත් රු.100,722 ක් අයවීමට තිබුණි.

(ආ). බිංගිරිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 2009 වර්ෂයේ සිට පැවත එන රු.55,905 ක පමණ කුලි හිඟයක් පැවතුණි.

2.3.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

(අ). සභා බල ප්‍රදේශය තුල පවතින සංචාරක මංඩලයේ ලියාපදිංචි හෝටල් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය විධිවිධාන අනුව හෝටලයේ පිරිවැටුම මත 1% ක් නොඉක්මවන ගාස්තුවක් අයකර ගත හැකි වුවද, සභාව විසින් එලෙස හඳුනාගෙන තිබූ එක් ආයතනයක් මගින් වාර්ෂිකව රු.3,000 ක ගාස්තුවක් පමණක් අයකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු අයකර ගත හැකි ස්ථාන හඳුනාගැනීම සඳහා වූ සමීක්ෂණයක් 2011 වර්ෂයේ ඔක්තෝබර් මස සිදුකර තිබූ අතර එම සමීක්ෂණය අනුව අනාවරණය වූ ස්ථාන 1357 න් ස්ථාන 887 ක් සඳහා පමණක් මුදල් අයකරගෙන පැවති අතර ඉතිරි ස්ථානයන් පිළිබඳව ලේඛන ගත කිරීමක් හෝ 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 63 විධිවිධාන පරිදි වූ හිඟ ලැයිස්තු පිළියෙල කිරීමක් හෝ හිඟ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) හා 150(4) ප්‍රකාරව ක්‍රියා කිරීමක් හෝ කර නොතිබුණි.

2.3.5 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභාව විසින් අනුමත කරන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් බලපත්‍ර හා පෙරසැරි ගාස්තු ලෙස රු.100 බැගින් හා රු.100,000 ක අනුමත කිරීම් ගාස්තුවක් අයකිරීමට සැළසුම් කර පැවතියද, සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඒවා හඳුනාගෙන ලේඛනගත කිරීමක් හෝ ඒ මත ගාස්තු අයකිරීමක් කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

2.3.6 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ වාහන නවතා තැබීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා තිබුණ ද එයින් ත්‍රීරෝද රථ ගාස්තු අයකිරීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචියක් හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදු කර නොතිබුණි. පිළිවෙලින් 2010 හා 2011 වර්ෂ වලට අදාලව ත්‍රීරෝද රථ 22 හා 24 ක් ලියාපදිංචි කර රු.6,700 ක් හා රු.6,400 ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණි.

2.3.7 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය රු.19,239,507 ක් විය.

2.3.8 <u>පරිසර බලපත්‍ර ගාස්තු</u>

සභාව විසින් පවත්වා තිබූ පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනයෙහි අදාල බලපත්‍රය නිකුත් කරන්නේ කුමන කර්මාන්තයක් සඳහාද යන්න සඳහන්ව නොතිබුණි. එමෙන්ම එකී ලේඛනය අනුව 2011 හා 2012 වර්ෂයට

අදාලව පරිසර බලපත්‍ර ඉල්ලුම් කිරීම් පිළිවෙලින් 251 හා 198 පැවති අතර එයින් බලපත්‍ර ලබාදී තිබුණේ පිළිවෙලින් ස්ථාන 121 කට හා 60 ක් සඳහා පමණි. බලපත්‍ර ලබා නොදුන් ඉතිරි ස්ථාන 268 පිළිබඳව පසු විපරමක් සිදුකර හෝ එකී ස්ථාන වල අනවසර ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේද පිළිබඳව සොයා බලා නොතිබුණි.

2.3.9 <u>විනෝද බදු</u>

විනෝද බදු අයකිරීම සඳහා ලේඛණයක් පවත්වා නොතිබූ අතර, සංදර්ශන වැනි අවස්ථාවලදී ප්‍රවේශ පත්‍ර මුද්‍රා තබා තැන්පතු මුදලක් ලබාගෙන තිබූ අතර අදාල සංදර්ශනයට අදාලව සභාව විසින් පරීක්ෂා කර වාර්තාවක් සකස් කිරීමක් හෝ එකී ඉල්ලුම් කරු විසින් නිකුත් කල ප්‍රවේශ පත්‍ර පිළිබඳ වාර්තා ලබාගෙන ඒ මත විනෝද බදු අයකිරීමක් සිදුව නොතිබුණි.

2.4 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව, වගකිව යුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුල මවිසින් පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.55,000 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.5 <u>වත්කම් කළමනාකරණය</u>

සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය පරිපාලන) රීති මාලාවේ රීති 218 හි විධිවිධාන පරිදි සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම රු.44,849,371 ක් විය.

2.6 <u>මානව සම්පත් කළමනාකරණය</u>

සභාවට අදාලව ආදායම් පරිපාලක තනතුරු දෙකකින් එකක් පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා කොමිස් පදනම මත පුද්ගලයකු බඳවාගෙන තිබුණි. සභාවේ වෛද්‍ය නිළධාරී තනතුරද පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා ආදේශක වෛද්‍යවරයෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.4,206,939 ක් ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 16,398 බැගින් එකී අරමුදල විසින් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). සභාව සතු සතිපොල 4 හි පොළ ගාස්තු සභාව විසින් එකතු කරමින් පැවතියද, එකී ගාස්තු අයකිරීම් වලට අදාලව වෙළඳුන් සඳහා පොළෙහි ඉඩකඩ වෙන්කර ඇති ප්‍රමාණයන් හා ඒ සඳහා අයකල යුතු ගාස්තු ඇතුලත් සැලැස්මක් සභාව සතුව නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල පොදු අරමුදල් යටතේ කර්මාන්ත 63 ක් වෙනුවෙන් රු.12,754,851 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ප්‍රතිපාදිත මුදල රු.4,352,717 ක් වූ කර්මාන්ත 27 ක් සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර හෝ නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය